# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/44 - 2022 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2022.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2022 අංක 11 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2022 අගෝස්තු මස 05 වැනි දින සිට බලාත්මක වේ.

3. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* **IV** වන උපලේඛනයෙන්, පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

1A - PG 5917 - 406 (2022/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | I තීරුව<br>ශීර්ෂ අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව<br>විස්තරය | IV තීරුව<br>ආනයන තහනම<br>**(B)** |
|---|---|---|---|---|---|
| 17 | 29.31 | | | **අනෙකුත් කාබනික - අකාබනික සංයෝග.** | |
| | | | - | අනෙකුත් කාබනික - පොස්පරස් ව්‍යුත්පන්න : | |
| | | 2931.39.00 | -- | අනෙකුත් | |
| | | 2931.39.10 | --- | N - (පොස්පෝනෝමෙතිල්) ග්ලයිසීන් සහ එහි ලවන හා ව්‍යුත්පන්න (ග්ලයිෆොසේට්) | **B** |

4. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* **I වන උපලේඛනයට**, පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | I තීරුව<br>ශීර්ෂ අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව<br>විස්තරය | IV තීරුව<br>ආනයන පාලන බලපත්‍රය<br>**(L)** |
|---|---|---|---|---|---|
| 371 | 29.31 | | | **අනෙකුත් කාබනික - අකාබනික සංයෝග.** | |
| | | | - | අනෙකුත් කාබනික - පොස්පරස් ව්‍යුත්පන්න : | |
| | | 2931.39.00 | -- | අනෙකුත් | |
| | | 2931.39.10 | --- | N - (පොස්පෝනෝමෙතිල්) ග්ලයිසීන් සහ එහි ලවන හා ව්‍යුත්පන්න (ග්ලයිෆොසේට්) | **L** |

5. ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා විසින්, ඉහත රෙගුලාසි අංක 4 හි සඳහන් කර ඇති භාණ්ඩ ආනයනය කිරීම සඳහා ආනයන පාලන බලපත්‍රයක් නිකුත් කිරීම පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශයට යටත්ව සිදු කළ යුතුය.

EOG 08 - 0063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.